කොළඹ අධ්‍යාපන කලාපය

දෙවන වාර පරීක්ෂණය - 2012

# ඉතිහාසය

(I කොටස)

07 වන ශ්‍රේණිය

මිනිත්තු 30 යි
thirty muinits

නම/ විභාග අංකය ..........................................................

※ පළමු කොටසේ සියලුම ප්‍රශ්න වලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.

※ අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න සඳහා වඩාත් නිවැරදි පිළිතුර දී ඇති පිළිතුරු අතරින් තෝරා යටින් ඉරක් අඳින්න.

(01) ශිෂ්ටාචාරයේ තොටිල්ල සහ සශ්‍රීකභාවයේ චන්ද්‍රවංකය යන නම් වලින් හැඳින් වූ ශිෂ්ටාචාරය නම්

(01) නයිල් නිම්න ශිෂ්ටාචාරයෙයි.
(02) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයයි.
(03) යුප්‍රටීස් - ටයිග්‍රීස් නිම්න ශිෂ්ටාචාරයයි.
(04) හොවැංහෝ නිම්න ශිෂ්ටාචාරයයි.

(02) යුප්‍රටීස් - ටයිග්‍රීස් නිම්න ශිෂ්ටාචාරයේ සිටි ආකේඩියන් රජෙකු වූ හමුරාබි රජු විසින් ලියන ලද හමුරාබි ප්‍රඥප්තිය.

(01) ආගමික ග්‍රන්ථයකි.
(02) වෛද්‍ය ග්‍රන්ථයකි.
(03) විද්‍යාත්මක ග්‍රන්ථයකි.
(04) නීති ග්‍රන්ථයකි.

(03) නයිල් නිම්න ශිෂ්ටාචාරය ව්‍යාප්ත වූ නයිල් නදිය නැගෙනහිර අප්‍රිකාවේ කඳුකරයෙන් පටන් ගෙන නැගෙනහිර වෙරළින් ගලා බසින්නේ,

(01) රතු මුහුදටය.
(02) මධ්‍යධරණී මුහුදටය.
(03) අරාබි මුහුදටය.
(04) කළු මුහුදටය.

(04) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ ආගමික ඇදහිලි විශ්වාස අතර වඩාත් ම ජනප්‍රිය වන්දනාව වූයේ,

(01) මව් දෙවඟන වැඳීමයි. (02) වෘක්ෂ වන්දනාවයි.
(03) ප්‍රතිමා වන්දනාවයි. (04) චෛත්‍ය වන්දනාවයි

(05) හොවැංහෝ ශිෂ්ටාචාරය පැවති යුගයේ සිටම චීනය වඩා ප්‍රසිද්ධියක් ගත්තේ,

(01) කහවනු හා මුදල් වලටයි.
(02) රන් හා රිදී භාණ්ඩ නිපදවීමටයි.
(03) පිඟන් භාණ්ඩ හා මැටි භාණ්ඩ වලටයි.
(04) යකඩ හා මිනිරන් වලටයි.

* අංක 6 - 11 දක්වා ප්‍රශ්න වලට ගැලපෙන පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.

(06) නගර කේන්ද්‍ර කොට ගෙන පාලන කටයුතු සිදු කළ කුඩා ස්වාධීන පාලන ඒකක හැඳින්වූයේ ................................................ යනු වෙනි.

(07) නූතන දේශපාලන විද්‍යාවේ පියා ලෙස සලකන්නේ ................................................ය.

(08) ග්‍රීක ජනතාව දෙවිවරු කෙරෙහි අසීමිත ලෙස ගෞරව කළ අතර සියලු දෙවිවරුන්ගේ අධිපති ලෙස සැලකෙන්නේ ................................................දෙවියන්ය.

(09) ක්‍රි. පූ. 59 - 44 දක්වා රජකළ රෝමයේ කීර්තිමත් අධිරාජ්‍යයා ලෙස සලකන්නේ. ................................................ය.

(10) සොළොස්මහා ජනපද අතරින් ඉතා බලසම්පන්න අධිරාජ්‍ය ලෙස කැපී පෙනුනේ ................................................අධි රාජ්‍යයයි.

(11) ආරාබි භාෂාවෙන් රචනා කොට ඇති ඉස්ලාම් ආගමිකයන්ගේ අති උත්තම ආගමික ග්‍රන්ථය ලෙස සලකන්නේ, ................................................යයි.

* අංක 12 සිට 15 දක්වා වාක්‍ය හරි නම් හරි (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද වරහන තුළ යොදන්න.

(12) අනුරාධපුර රාජධානිය වසර 1400 ක් පමණ දීර්ඝ කාලයක් තිස්සේ ලක්දිව අගනුවර ලෙස පැවතුනි. ( )

(13) අවුකන හා තොලුවිල බුද්ධ ප්‍රතිමා දක්විය හැක්කේ ගුප්ත ප්‍රතිමා ශෛලියට නිදසුනක් ලෙසයි. ( )

(14) සොළී දේශයේ සිට පැමිණි එළාර නම් කුමාරයෙක් අසේල රජු මරා රාජ්‍ය පැහැර ගෙන අවු. 44 ක් රට පාලනය කළේය. ( )

(15) ඉන්දියාවට පලාගිය මුගලන් කුමාරයා ඉන්දියාවෙන් හමුදා රැගෙන විත් කාශ්‍යප රජු මරා බලයට පත් විය. ( )

* අංක 16 සිට 20 දක්වා වාක්‍ය වල හිස්තැනට සුදුසු පිළිතුර පහත දී ඇති පිළිතුරු වලින් තෝරා ලියන්න.

(16) පොළොන්නරුව........................................ ගඟ අසබඩ පිහිටීම නිසා වාර්මාර්ග වඩාත් යෝග්‍ය ප්‍රදේශයක් විය.

(17) පළමු විජයබාහු රජු........................................ සිට සේනාව තුන් පැත්තකින් මෙහෙයවා අවසානයේ සොළීන් පරදවා පොලොන්නරු නගරය ජය ගත්තේය

(18) ''මාගේ මේ රාජ්‍යයේ අහසින් වැටෙන එක් දිය බිඳකුදු ලෝකපකාරයෙන් තොරව මුහුදට ගලා යාමට නොදෙමි.'' මෙලෙස ප්‍රකාශ කළේ.................................................................. රජුය.

(19) නිශ්ශංක මල්ල රජු විදේශීය ප්‍රතිපත්තියේදී.................................................................. දේශය හා සොළී රට ආක්‍රමනය කර කප්පම් ලබාගෙන ඇත.

(20) විවිධ බාධක මැද බුද්ධ ශාසනයේ දියුණුවට කටයුතු කළ.................................................................. රැජිණ මුවදෙව්දාවත සහ සසදාවත යන කෘති රචනා කිරීමට අනුග්‍රහය දැක්වූවාය.

(කාලිංස,කැළණි, ලීලාවතී, නිශ්ශංකමල්ල රජු, පාණ්ඩ්‍ය, කතරගම, මහානාගහුල, මහවැලි, I පරාක්‍රමබාහු රජු, කල්‍යාණිවතී, මාගම)

( මුළු ලකුණු **2 x 20 = 40** )

කොළඹ අධ්‍යාපන කලාපය
දෙවන වාර පරීක්ෂණය - 2012

# ඉතිහාසය
(II කොටස)

07 වන ශ්‍රේණිය

පැය 01 විනාඩි 30 යි
one hour & Thirty muinits

නම/ විභාග අංකය ....................................................

## II කොටස

❋ පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.

❋ දෙවන වාරයේදී ඔබ ඉගෙනගත් පාඩම් ඒකක ආශ්‍රයෙන් පන්තියේදී සැකසූ තොරතුරු ගොනුව ඇසුරින් පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

(01) (i) තොරතුරු ගොනුව සැකසීමට ඔබේ කණ්ඩායමට ලැබුණු මාතෘකාව ලියන්න.(ලකුණු 01)

(ii) එම මාතෘකාවට තොරතුරු ලබා ගත් මූලාශ්‍ර 2 ලියන්න. (ලකුණු 02)

(iii) එම් තොරතුරු ගොනුව සැකසීමට ඔබේ කණ්ඩායම යොදාගත් ද්‍රව්‍ය 3 ලියන්න. (ලකුණු 03)

(iv) මෙම කණ්ඩායම් ක්‍රියාකාරකමේදී ඔබේ කණ්ඩායම මුහුණ දුන් අභියෝග 3 ක් ලියන්න. (ලකුණු 03)

(v) එම අභියෝග විසඳා ගැනීමට ඔබේ කණ්ඩායමට උදව් හා උපදෙස් ලබා ගත් පුද්ගලයින් දෙනෙක් නම් කරන්න. (ලකුණු 03)

(vi) මෙවැනි ක්‍රියාකාරකම් තුළින් ඉතිහාසය විෂය ඉගෙනීමට හා ජීවිතයේ ඉදිරි ගමනට ඔබට ලැබුණු ප්‍රයෝජන 4 ක් ලියන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 16)

(02) (i) අතීතයේදී මෙසපොතේමියාව හා මිසරය යන නම් වලින් හැඳින්වූ රටවල් දෙකට වර්තමානයේ දී භාවිත කරන නම් දෙක ලියන්න. (ලකුණු 02)

(ii) ලෝක ප්‍රසිද්ධ ශිෂ්ඨාචාර 4 බිහිවීමට බලපෑ ප්‍රධාන ගංගා 4 ලියන්න. (ලකුණු 04)

(iii) සෑම ශිෂ්ඨාචාරයක්ම බිහිවී ව්‍යාප්ත වී ඇත්තේ ගංගාවක් ආශ්‍රිතවයි. මේ සඳහා බලපෑ සාධක දෙකක් ලියන්න. ඒවා ගැන විස්තරයක්ද කරන්න. (ලකුණු 05)

(03) (i) ඉන්දු නිම්න ශිෂ්ටාචාරය නගර දෙකක් මධ්‍යස්ථාන කරගෙන ව්‍යාප්ත වී ඇත. එම නගර දෙක නම් කරන්න. (ලකුණු 02)

(ii) ඉන්දු නිම්න ශිෂ්ඨාචාරය ක්‍රමයෙන් නාගරික තත්වයට පත්වී ඇත. මේ බව තහවුරු කිරීමට සාධක 4 ක් ලියන්න. (ලකුණු 04)

(iii) හොවැංහෝ නදී නිම්න ශිෂ්ටාචාරයේ ආගමික ඇදහිලි හා විශ්වාස ගැන කරුණු 2 ක් දක්වා විස්තරයක් කරන්න. (ලකුණු 05)

04. (i) පහත සඳහන් වාක්‍ය දෙකට අදාල පුද්ගලයන් දෙදෙනාගේ නම් ලියන්න.

❋ "රිපබ්ලික් හෙවත් සමූහාණ්ඩුව" නම් ග්‍රන්ථය ලියූ දාර්ශනිකයා.

❋ "බටහිර වෛද්‍ය විද්‍යාවේ පියා" ලෙස සැලකෙන විද්‍යාඥයා (ලකුණු 02)

(ii) පෞර රාජ්‍ය වල ලක්ෂණ 4 ක් ලියන්න. (ලකුණු 04)

(iii) ග්‍රීක ජන ජීවිතයේ කැපී පෙනෙන ලක්ෂණ දෙකක් ලියන්න. ඒවා විස්තර කරන්න. (ලකුණු05)

05. (i) පහත A හා B පින්තූර වලින් පෙන්නුම්කරන දාර්ශනිකයන් දෙදෙනාගේ නම් ලියන්න. (ලකුණු 2)



A



B

(ii) රෝම නීතියේ ප්‍රධාන ලක්‍ෂණ 4 ක් සඳහන් කරන්න. (ලකුණු 4)

(iii) බිම්බිසාර රජු මගධ රාජ්‍ය බලවත් කිරීමට යොදාගත් උපක්‍රම දෙකක් ලියා ඒවා විස්තර කරන්න. (ලකුණු 05)

06. (i) ලංකාවට පැමිණි සොළීන් යටත් කරගත් ලංකාවේ උතුරු ප්‍රදේශය හා පොළොන්නරුව හැඳින්වූ නම් පිළිවෙලින් ලියන්න. (ලකුණු 02)

(ii)




ඉහත සිතියමේ A B C D යන ඉංග්‍රීසි අක්ෂර වලින් පෙන්නුම් කරන්නේ ශ්‍රී ලංකාවට විවිධ බලපෑම් එල්ල කළ දකුණු ඉන්දියානු රාජ්‍යයන් 4 යි. එම රාජ්‍යයන් 4 පිළිවෙලින් නම් කරන්න. (ලකුණු 04)

(iii) ශ්‍රී ලංකාව නිතර නිතර දකුණු ඉන්දියානු ආක්‍රමණ වලට ගොදුරු වීමට බලපෑ හේතු රාශියකි. එයින් හේතු 2 ක් ලියා විස්තර කරන්න. (ලකුණු 05)

07. (i) පළමු වන විජබාහු රජුගේ පියාගේ හා මවගේ නම් ලියන්න. (ලකුණු 02)

(ii) පළමු වන පරාක්‍රම බාහු රජතුමා විසින් කරවන ලද බෞද්ධ වෙහෙර විහාර 4 ක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) නිශ්ශංක මල්ල රජු විසින් ඉටුකළ ජාතික ආගමික සේවා දෙකක් ලියා ඒ පිළිබඳ විස්තරයක්ද කරන්න. (ලකුණු 05)